රුහුණ විශ්වවිද්‍යාලය
றுஹுணு பல்கலைக்கழகம்
UNIVERSITY OF RUHUNA

වැල්ලමඩම මාතර 81000 ශ්‍රී ලංකාව வெல்லமடம மாத்தறை 81000 இலங்கை WELLAMADAMA, MATARA 81000 SRI LANKA

මගේ අංකය / எனது எண் / My No. RU/SA/04

ඔබේ අංකය / உங்களது எண் / Your No.

2022.02.23

පීඨාධිපති මගින්

(කෘෂිකර්ම/මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා /වෛද්‍ය /විද්‍යා /ඉංජිනේරු/කළමනාකරණ හා මූල්‍ය/

ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ/තාක්ෂණ/සම සෞඛ්‍ය විද්‍යා) පීඨය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / සහකාර ලේඛකාධිකාරී

(කෘෂිකර්ම/මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා /වෛද්‍ය /විද්‍යා /ඉංජිනේරු/කළමනාකරණ හා මූල්‍ය/

ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ/තාක්ෂණ/සම සෞඛ්‍ය විද්‍යා) පීඨය.

## කුසලතා ශිෂ්‍යත්ව පිරිනැමීම - 2019/2020

2022.01.11 දින පැවැති ශිෂ්‍යත්ව කමිටු රැස්වීමේ තීරණය පරිදි ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කර නොමැති පීඨ වෙත නැවත අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස තීරණය කරන ලදී.

ඒ අනුව, මේ සමග අමුණා ඇති ලේඛනයේ සඳහන් ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබන ඔබ පීඨයේ සිසුන්ගේ නාම ලේඛනය හා නිර්දේශිත ශිෂ්‍යත්වලාභීන්ගේ අයදුම්පත්‍ර පීඨ ශිෂ්‍යත්ව කමිටු නිර්දේශය ද සහිතව **2022.03.11 දිනට පෙර** ශිෂ්‍ය කටයුතු අංශය වෙත යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

අදාල ආදර්ශ අයදුම්පත මේ සමග අමුණා ඇත.

සහකාර ලේඛකාධිකාරී
ශිෂ්‍ය කටයුතු.

සහකාර ලේඛකාධිකාරී
ශිෂ්‍ය කටයුතු අංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

පිටපත - නියෝජ්‍ය උපකුලපති

# 2019/2020 ශිෂ්‍යත්ව සඳහා නැවත අයදුම් කිරීම

| අංකය | ශිෂ්‍යත්වයේ නම | ශිෂ්‍යත්වයේ වටිනාකම (රු.) | ශිෂ්‍යත්ව ගණන | අයදුම් කළ හැකි පීඨ | නිර්ණායක |
|---|---|---|---|---|---|
| 01 | කේ.ජී.කේ. වෛදනිත | ශිෂ්‍යත්ව කමිටුව නිර්දේශ කරනු ලබන මුදල | 02 | සියලුම පීඨ | අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල අනුව රුහුණ විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ මාතර වල්ගම මහා විද්‍යාලයේ ශිෂ්‍යයන්ට සහ මාතර සුජාතා බාලිකා විද්‍යාලයේ අඩු ආදායම්ලාභී ශිෂ්‍යාවන්ට මේ ශිෂ්‍යත්වය සඳහා අයදුම් කළ හැකිය. |
| 02 | චන්ද්‍රපාල වීරකෝන් | වාරිකයක් රු.1000.00 බැගින් වසරකට රු.10000.00ක් බැගින් උපරිමය රු. 36000.00 | 03 | ඉංජිනේරු, විද්‍යා, වෛද්‍ය | ඉංජිනේරු පීඨ පළමු වසර පරීක්ෂණවල ප්‍රතිඵල අනුව ප්‍රථම පන්තිය හෝ දෙවන පන්තිය ඉහළ හෝ පහළ සාමාර්ථයකට අදාල සාමාන්‍ය ශ්‍රේණි මධ්‍ය අගයන් ඇති සිසුන් හෝ විද්‍යා පීඨයේ පළමු වසර පරීක්ෂණ වල ප්‍රතිඵල අනුව ඉහළම සාමාර්ථයක් ලබා විශේෂවේදී පාඨමාලාව සඳහා සුදුසුකම් ලබන සිසුන් හෝ වෛද්‍ය පීඨයේ 2 MBBS පරීක්ෂණයෙන් ප්‍රථම පන්තියේ හෝ දෙවැනි පන්තියේ ඉහළ හෝ පහළ සාමාර්ථයක් හිමි සිසුන්ට මහපොළ/ශිෂ්‍යාධාර හැර වෙනත් ශිෂ්‍යත්වයක් නොලැබෙන්නේ නම් මෙම ශිෂ්‍යත්වය සඳහා අයදුම් කළ හැකිය. |
| 03 | එන්සිනා වික්‍රමසේකර අනුස්මරණ | 500.00 ( එක් අවස්ථාවක් සඳහා පමණක් සීමා කර ශිෂ්‍යත්වය පිරිනැමේ.) | 06 | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා/විද්‍යා/කළමනාකරණ හා මූල්‍ය/කෘෂිකර්ම/ඉංජිනේරු / වෛද්‍ය | පවුලේ වාර්ෂික ආදායම රු.144,000.00 ට අඩු රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා/විද්‍යා/කළමනාකරණ හා මූල්‍ය/කෘෂිකර්ම/ඉංජිනේරු / වෛද්‍ය පීඨ ප්‍රථම වසර පරීක්ෂණයෙන් සමත් සිසුන්ට |
| 04 | ජයන්ත ශ්‍රියා රාසපුත්‍රම් | ශිෂ්‍යත්ව කමිටුව තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය ශිෂ්‍යත්ව මුදල | 01 | වෛද්‍ය | මාතර දිස්ත්‍රික්කයෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා ඇතුළත් ව එහි 3 වන MBBS පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබා ගෙන ඇති අඩු ආදායම්ලාභී ශිෂ්‍යාවක හෝ ශිෂ්‍යයකුට |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | රුහුණ විශ්වවිද්‍යාල | රු. 4,000.00 (එක් වරක් පමණි) | 09 | සියලුම පීඨ | විභාග ප්‍රතිඵල මත, GPA අගය අවම වශයෙන් දෙවන පෙළ ඉහළ පන්ති සාමාර්ථය සපුරා ඇති සහ පවුලේ වාර්ෂික ආදායම රු. 300,000.00 අඩු සෑම පීඨයකින් එක් සිසුවකු තෝරාගෙන ශිෂ්‍යත්වය පිරිනැමීම. |
| 06 | මහාචාර්ය රන්මුතු විජේනායක | එක් වර්ෂයක් සඳහා පමණක් රු.7500.00 | 01 | විද්‍යා | පළමු හා දෙවන වසර පරීක්ෂණයෙන් රසායන විද්‍යා විෂයයට ඉහළ ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට |
| 07 | ඩබ්.ඒ. ගිමෝනා | එක් අධ්‍යයන වර්ෂයක් සඳහා පමණක් රු. 10,000 | 01 | ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ | මත්ස්‍ය ජීව විද්‍යා විෂය හදාරන සිසුන් අතරින් පළමු වසර හොඳම ප්‍රතිඵල පෙන් වූ ශිෂ්‍ය /ශිෂ්‍යාවකට මෙම ශිෂ්‍යත්වය පිරිනැමේ |
| 08 | ජයමිණි සමරවීර | මසකට රු.2500.00 බැගින් වසරකට මාස 10 ක උපරිමයකට යටත්ව වසර 4 ක් සඳහා ශිෂ්‍යත්ව කමිටුව තීරණය කරන පරිදි | 01 | ඉංජිනේරු | ශිෂ්‍යත්වයක අවශ්‍යතා ඇති හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව සුදුසුකම් සපුරා ඇති ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හැදෑරීම සඳහා මාතර දිස්ත්‍රික්කයෙන් රුහුණ විශ්වවිද්‍යාලය වෙත තේරී ඇති සිසුන්ට |
| 09 | බෙනී වික්‍රමසේකර | ශිෂ්‍යත්ව කමිටුව තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය ශිෂ්‍යත්ව මුදල | 01 | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | මාර/සුජාතා බාලිකා විද්‍යාලයෙන් සමත්වී රුහුණ සරසවියේ කලා පීඨයේ පළමු වසර පරීක්ෂණයෙන් එම විද්‍යාලයෙන් වැඩිම ලකුණු ලබා ගන්නා ශිෂ්‍යාවවීම |
| 10 | දිසාමෝදා අමරසිංහ | ස්ථාවර ගිණුමෙන් ලැබෙන පොලී ආදායම (වසරකට එක් වරක් පමණි) | 02 | වෛද්‍ය (2021 හා 2022 වර්ෂවලට) | ගාල්ල මහින්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා වෛද්‍ය පීඨය සඳහා ඇතුළත් වන දක්ෂතම ශිෂ්‍යයාට |

## ප්‍රදාන ශිෂ්‍යත්ව සඳහා ආදර්ශ අයදුම්පත්‍රය

**අයදුම් කරන ශිෂ්‍යත්වයේ නම :- ..........................................................**

1. සම්පූර්ණ නම :- ........................................................................................................

2. ඉගෙනුම ලබන පීඨය :- .................................... 3. ශිෂ්‍ය ලියාපදිංචි අංකය :- .................................

4. අ.පො.ස.(උ/පෙළ) හැදෑරූ පාසල :- .........................................................................................

5. දුරකථන අංකය :- .......................................................................................................

6. ස්ථිර ලිපිනය :- .......................................................................................................

7. මහපොළ / ශිෂ්‍යාධාර ලබන්නේද ? ................................ එසේ නම් ලබන මුදල :- රු. ..........................

8. පියාගේ වාර්ෂික ආදායම් තත්ත්වය :- රු. .............................................................................

9. මවගේ වාර්ෂික ආදායම් තත්ත්වය :- රු. .............................................................................

(මව/පියා/භාරකරු රැකියාවක් කරන්නේනම් සියළු දීමනා සහිතව වර්ෂයකට ලැබෙන වැටුප සඳහන් කර සේවා ආයතනයේ ප්‍රධානියාගෙන් ලබා ගත් සහතිකයක් හෝ විශ්‍රාම ගොස් නම් සියළු දීමනා සහිතව වර්ෂයකට ලැබෙන විශ්‍රාම වැටුප හෝ වාර්ෂික සම්පූර්ණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප හෝ සඳහන් කර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ හෝ ප්‍රාදේශීය ලේකම් ගෙන් ලබා ගත් සහතිකයක් ඇමිණිය යුතුය. සමෘර්ධිලාභියෙකු නම් එම කාඩ්පතෙහි සහතික කළ පිටපතක් සමග සමෘර්ධි සංවර්ධන නිළධාරී විසින් සහතික කළ ලිපියක් ඇමුණිය යුතුය.)

ඉහත සඳහන් කරුණු නිවැරදි බව සනාථ කරමි.

..................................

දිනය :- ...................................... අයදුම්කරුගේ අත්සන

10. ග්‍රාම නිළධාරී නිර්දේශය:-

.......................................................නැමති ශිෂ්‍යයාගේ පවුලේ වාර්ෂික ආදායම රු. ............................ බවත් ඉහත තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බව සහතක කරමි / නොකරමි.
තවද මාගේ දැනීමේ පරිදි අයදුම්කරු මෙම ශිෂ්‍යත්වය ලැබීමට සුදුසුසකු බවද පහත සඳහන් හේතුන් නිසා නුසුදුස්සකු බවද සහතික කරමි.

..................................................

ග්‍රාම නිළධාරී අත්සන හා නිල මුද්‍රාව

දිනය :-

ග්‍රාම නිළධාරී නිර්දේශය තහවුරු කරමි/නොකරමි.

..................................................................

ප්‍රාදේශීය ලේකම් අත්සන හා නිල මුද්‍රාව

දිනය :-

11. පීඨාධිපති හා නියෝජ්‍ය ශිෂ්‍ය උපදේශක නිර්දේශය :-

........................................................ ශිෂ්‍යයා/ශිෂ්‍යාව මෙම ශිෂ්‍යත්වය ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව නිර්දේශ කරමි.

.................................................................. 
නියෝජ්‍ය ශිෂ්‍ය උපදේශක අත්සන 
දිනය :-

.................................................................. 
පීඨාධිපති අත්සන හා නිල මුද්‍රාව 
දිනය :-

*සැ.යු. පහත ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරන සිසුන් පමණක් අංක 07,08 සහ 09 ට අදාල තොරතුරු සම්පූර්ණ කළ යුතු බව සළකන්න.*

*01. කේ.ජී.කේ. වේදහිත ශිෂ්‍යත්වය.*
*02. එන්සිනා වික්‍රමසේකර ශිෂ්‍යත්වය.*
*03. ජයන්ත ශ්‍රී රාසපුත්‍රම් ශිෂ්‍යත්වය.*
*04. රුහුණ විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව*